


**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel/Fax 03 9796 4241
(After 4 pm)

www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
ශ්‍රීනාත් මද්දුමගේ
Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

# ලියා දන්වන වගයි

## දෙවන දශකය මෙසේ අරඹමු

මේ සන්නසේ දෙවන දශකයේ අරඹුමයි. දශකයක දිග ගමනකින් පසු ගත වූ කාලයේ කළ කී දෑ පිළිබඳව නැවත හැරී බලා තක්සේරුවක් කරගන්නට අපට දැන් හැකියාවක් ඇත.

සන්නස ඇරඹෙන්නේ ඕස්ට්‍රේලියා සිංහල මුද්‍රිත මාධ්‍ය ක්ෂෙත්‍රයේ යම් හිස්තැනක් පිරවීමට ඇතැයි සාලිය ගලප්පත්ති අසෝක සුබසිංහ සහ ආනන්ද කුමාරසිරි යන සහෘදයන් සිතූ නිසාවෙනි. සන්නස අරඹන මොහොතේදීම අපේ අරමුණ වූයේ තවත් එක පත්තරයක් වනු වෙනුවට සමාජයට අවදිකරවන සමාජය දැනුම්වත් කරවන උණුසුම් පුවත්පතක් බවට සන්නස පත් කරන්නටය. එය පහසු නැත. කිසිවකුගේ උදහසට ලක් නොවන ආකාරයේ ලිපි පළකර පුවත්පතක් නිකුත් කිරීම පහසු නමුත් විවිධ පුද්ගලයන්ගේ අදහස් වලට එරෙහිව යන පුවත්පතක් පවත්වාගෙන යාම අභියෝගයකි.


April 2005
Sri Lankan Community Magazine
සන්නස
Issue 1
FREE
1505 සිට 2005 දක්වා...

සන්නස මංගල කලාපය 2005 අප්‍රේල්

සන්නස කිව යුත්ත කිව යුතු තැනදී නොබියව කීවේය. සන්නස සැම විටම විවෘත ලෙස කතා කළේ ය. එයට සඟවාගන්නට දෙයක් නොවීය. සන්නස මහින්ද රාජපක්ෂට බලයට එන්නට සහයෝගය දුන්නේය. ඒ ඔහු හොඳ වැඩ පිළිවෙලක් රටට ඉදිරිපත් කළ නිසාය. ඒ මහින්ද පොරොන්දු කඩා දමන විට ඔහු නොමග ගිය විට ඔහු ඉවත් කරන්නට කළ හැකි සියල්ල කරන්නටද සන්නස පසුබට නොවීය. ඒ සන්නස පුද්ගලයන් වන්දනාමාන නොකරණ නිසා ය. සන්නස වන්දනාමාන කරන්නේ ප්‍රතිපත්ති සහ වැඩ පිළිවෙල පමණකි. පුද්ගලයන් පස්සේ දුවන දේශපාලනයේ සන්නස නැත්තේ එනිසා ය. ඉදිරියටත් සන්නසේ ඒ ප්‍රතිපත්තිය එලෙසම පවතිනු ඇත.

සන්නස විවෘත වේදිකාවක් ලෙස පවත්වාගෙන යන්නට අපි සැම විටම උනන්දු වූයෙමු. විවිධ දේශපාලන පක්ෂ වලට සහයෝගය දක්වන ලිපි සන්නසේ පළවෙයි. අපි ඒ සියළු අදහස් වලට ගරු කරන්නෙමු. සමහර අදහස් වලට අප එකඟ නොවුණද ඒ අදහස් පළකරන්නට ඒ ඒ ලේඛකයන්ට ඇති අයිතියට අපි ගරු කරන්නෙමු. ඒසේම ඒ අදහස් වලට පිළිතුරු දෙන්නට ඒ අදහස් සමග ගැටෙන්නට අපේ පාඨකයනට ඇති අයිතියටද අපි ගරු කරන්නෙමු.

අලුත් ලේඛක පරපුරක් බිහි කරන්නට අපි සැමවිටම වෙහෙසෙන්නෙමු. සන්නස හරහා බිහි වූ නව ලේඛක පරපුර අපට සතුටකි. සන්නස පුවත්පත් පිටු මත සිය අදහස් ලියා තබන්නට අපෙන් ඉල්ලා සිටි කිසිවකු අප හරවා යවා නැති බව විශ්වාසයෙන් කිවයුතුය. ඔවුන් අතින් ලියැවෙන විවාදසම්පන්න අදහස් පවා අපි වාරණයකින් තොරව පළ කර ඇත්තෙමු.

දෙවන දශකය සන්නස අරඹන්නේ වෙනස්කම් කීපයක් සමගින් ය. ව්‍යාපෘතියක උණුසුම රැක ගැනීමට වෙනස්කම් අවශ්‍ය යයි අපි තරයේ විශ්වාස කරමු. ඕනෑම ව්‍යාපෘතියක ජවය රැඳෙන්නේ නව අදහස් සමගින්ය. නව අදහස් සඳහා ඇති ඉඩකඩ අවුරා ලන ලද කළ ඇතිවන ඒකාකාරීත්වයට අපි අකැමැත්තෙමු. එනි සසන්නස දවසින් දවස අලුත් වනු ඇත. ඒ පාඨක ඔබ වෙනුවෙන් ය.

ඔබ සැම දස වසක් අප සමග අත්වැල් බැඳගෙන සිටි ආකාරය අපේ සිත්වල සදා රැඳී ඇත. අප මේ සා දුරක් රැගෙන ආවේ ඔබ ය. අපට ශක්තිය දුන්නේ ඔබය. අපට තර්ජන එල්ල වන විට අප වෙනුවෙන් පෙනී සිටියේ ඔබය. වචනයකින් හෝ ධෛර්යයක් දුන්නේ ඔබය. ඔබේ ඒ සුහදතාවට අපි හිස නමා ආචාර කරන්නෙමු.

සන්නසට ලියන අපේ ලේඛක පිරිවර පිළිබඳව අප සිත්හි ඇත්තේ මහත් ගෞරවයකි. ඔවුන් අප සමග සිටින්නේ කිසිදු ආර්ථික ප්‍රතිලාභයකින් තොරව ය. ඔවුන්ගේ කැපවීම අපේ ගමනට ශක්තියකි.

සන්නස ඔබේ අදහස් වලට සවන්දෙන්නට කැමැත්තෙන් සිටියි. ඔබේ අදහස් අපට ලියා එවන්නට හෝ අපට කතා කර කියන්නට හෝ ඔබට හැකිය. ඒ අදහස් සන්නසේ දෙවන දශකයේදී වඩාත් සැළකිල්ලට ගැනෙනු ඇත.

ඉතින් අපි දැන් නැවත වතාවක් ගමන් අරඹමු. එන්න. අපි එක්ව මේ දුෂ්කර ගමන යමු. යා යුතු දුර කොපමණ දැයි නොදැනම නොසිතාම අපි ඉදිරියටම යමු.